# අධ්‍යාපන අමාත්‍යාංශය

# 6 ශ්‍රේණිය - 1 කොටස

# ප්‍රායෝගික හා තාක්ෂණ කුසලතා




**මෙහෙයවීම -**

තාක්ෂණ ශාඛාව

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ

එල්. එස්. කේ. වික්‍රමසිංහ මිය.

**සැලසුම් කිරීම සහ සකස් කිරීම -**

කේ. ඒ. ඩී. ප්‍රියානි ජයමැණිකේ මිය.

ගෘහ ආර්ථික විද්‍යා ගුරු උපදේශක

(කැලණිය අධ්‍යාපන කලාපය)

# 01 තාක්ෂණික ක්ෂේත්‍රය කෘෂිකර්මය

## සරු බිමෙන් නෙළමු අපි අස්වනු



දුවේ පුතේ පෙළපොතේ පාඩම් කියවන්න. පහත දක්වා ඇති ක්‍රියාකාරකම්වල යෙදෙන්න. ඔබේ ක්‍රියාකාරකම් ඔබත් සමඟ පෙනී සිටින ඡායාරූපයකින් ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කරන්න. ලකුණු ලබා ගන්න. සතුටු වෙන්න. ඔබේ හැකියා හඳුනා ගන්න.

1. ඔබ නිවස අවට, පරිසරයේ ඇති ශාක නම් කර ප්‍රයෝජන ලයිස්තු ගත කරන්න.





2. ගෙවත්තේ ශාක සිටුවීමෙන් ඔබට හා අන් අයට ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න.

3. යහපත් සහ සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට අපේ ගෙවත්ත සකස් කර ගැනීමේ දී අප කළ යුතු දෑ ලියන්න.





4. බෝග වගාව තුලින් අප රැක ගත යුතු දේ ලියන්න.

5. බෝග වගාවට සුදුසු පරිසරයේ තිබිය යුතු දෑ ලියන්න.





6. පෙළ පොතේ පස් වන පිටුවෙහි සඳහන් පරිදී බෝගවල ප්‍රයෝජනය අනුව කාණ්ඩ කරන්න.

7.රෝපණ ද්‍රව්‍ය යනු මොනවාද?

8. විවිධ බෝගවල රෝපණ ද්‍රව්‍ය ලයිස්තු ගත කරන්න.






9.විවිධ රෝපණ ද්‍රව්‍ය හඳුනා ගත් පසු බීජ ප්‍රරෝහණය සඳහා යොදා ගත හැකි පූර්ව ප්‍රතිකාරක මොනවාදැයි සොයා වගු ගත කරන්න.

10. පූර්ව ප්‍රතිකාර ලෙස තවදුරටත් යොදා ගත හැකි ද්‍රව්‍ය හෝ ක්‍රම සොයා බලා තොරතුරු ගොණුවක් සකස් කර ගුරුතුමියට / ගුරුතුමාට පෙන්වන්න.



11. උස් පාත්ති සකස් කිරීමේ වාසි ලියන්න.

12. උස් පාත්ති සකස් කිරීමේ අවාසි ලියන්න.



## ක්‍රියාකාරකම.

උස් පාත්ති පිළිබඳ අධ්‍යනය කළ දුවේ, පුතේ ඉහත මතුවූ ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා ඔබේ පෙළ පොතේ සඳහන් රාමුවක් සහිත උස් පාත්තිය, නිවසේ , ගෙවත්තේ ඇති ඉඩකඩට ප්‍රමාණවත් පරිදී, වැඩිහිටියන්ගේ උදව් ඇතිව සකස් කර එහි ඡායාරූපයක් ගුරුතුමාට / ගුරුතුමියට යවන්න. ලකුණු ලබා ගන්න. දැනුම යහළුවන් අතර හුවමාරු කර ගන්න.

13. එම පාත්තිය සකස් කිරීමේ දී මතුවූ ගැටළු ලියන්න.

14. එහි වාසි මොනවාද? ලියන්න. ගුරුතුමාට / ගුරුතුමියට පෙන්වා ලකුණු ලබා ගන්න.





15.ඉහත සඳහන් පාත්තියේ රාමුව සැකසීම සඳහා යොදා ගත හැකි වෙනත් ඉවත දමන ද්‍රව්‍ය ලයිස්තුවක් පිළියෙල කරන්න. ඔබේ දැනුම යාළුවන් අතර හුවමාරු කර ගන්න.

16. පාත්තියේ බෝග සිටුවීමට පෙළ පොත අධ්‍යනය කර තොරතුරු ලබා ගන්න. සිටවූ බෝග මොනවාද?

17. එම බෝගවල සාර්ථකව අස්වනු නෙළා ගැනීමට නඩත්තු කරන්නේ කෙසේ ද?





18. ඇසට පෙනෙන වගා මිතුරන් නම් කරන්න.

19. වගා මිතුරු ශාක මොනවාද?

20. බෝගවලට ඇතිවිය හැකි රෝග මොනවාද? අවට පරිසරයෙන් සොයන්න.

21. එම රෝග සහ පළිබෝධ හානි අවම කර ගැනීමට සරළ ප්‍රතිකර්ම සොයන්න. වැඩිහිටියන්ගෙන් විමසන්න.

22. වල්පැල පාලනය කරන්නේ කෙසේ ද?

23. පාංශු ජල සංරක්ෂණය යනු කුමක්ද?

24. වසුන් වශයෙන් යොදා ගත හැකි අමුද්‍රව්‍ය මොනවාද?

25. ඔබේ පාත්තියෙන් මුල්ම අස්වනු නෙලාගත් දවස සටහන් කරගන්න. ගෙදර සාමාජිකයන්ගේ අදහස් ලියන්න. ඔබත් සමඟ ඡායාරූපයක් ගුරුතුමියට යවන්න.



# 02 තාක්ෂණික ක්ෂේත්‍රය ආහාර

## ගුණ නොනසා සුරකිමු අපි ආහාර



1.ආහාර යනු මොනවාද?

2.මෙහි දැක්වෙන්නේ කුමක්ද? මෙහි අවශ්‍යතාවය ලියන්න.

3.අප ගතයුතු ආහාර මෙනවාද?

4අප ගන්නා ආහාරවලින් සිරුරට ලැබෙන ප්‍රයෝජන මොනවාද?






5. ආහාරවල ගුණාත්මක තත්ත්වයට හානි විය හැකි අවස්ථා මොනවාද?

6. මෙම තත්ත්වයන් වළක්වා ගැනීමට අවධානය යොමු කළ යුතු කරුණු මොනවාද?

7. වෙළඳපොළ තුළ ආහාර ගබඩා කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු මොනවාද?

8. නැවුම් ආහාරවල ගුණාත්මක ලක්ෂණ මොනවාද?





9. නිවසට ගෙවත්තෙන් හෝ වෙළඳපොළෙන් ගෙනෙන ලද ආහාර ද්‍රව්‍ය කිහිපයක් ඔබට මෙම රූපසටහනෙන් දැක ගත හැක. එහි අඩංගු ආහාර පහක් තෝරා ගෙන ගුණාත්මක තත්ත්වය වගු ගත කරන්න ඒ සඳහා පෙළ පොතේ වගුව අධ්‍යනය කරන්න.

10.සැකසූ ආහාර යනු මොනවාද?

11. වෙළෙඳපොළෙහි ඇති සැකසූ ආහාර ලයිස්තු ගත කරන්න.

12. සැකසූ ආහාරවලින් ඇති වාසි මොනවාද?






















13.නිවසට ගෙනෙන විවිධ ආහාර ගබඩා කරන ආකාරය සොයා බලන්න.

14. ඒවා පරිභෝජනය කරන තෙක් ගබඩාකර තබන ආකාරය වගුගත කරන්න. ගුරුතුමාට / ගුරුතුමියට පෙන්වන්න.

| ආහාරය | ගබඩා කළ හැකි ආකාරය. |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

# තාක්ෂණික ක්ෂේත්‍රය - ආරම්භක තාක්ෂණවේදය

# 03

## නිසි ආවුද නිසි කාර්යයට





1. මෙම භාණ්ඩය සකස් කිරීමට යොදා ගෙන ඇති ද්‍රව්‍ය ලියන්න.


2. පෙළ පොත අධ්‍යනය කරමින් එය තැනීමේ තාක්ෂණ ක්‍රියාවලිය සටහන් කරන්න.

3. ඔබට එදිනෙදා හමුවන මෙවැනි අමුද්‍රව්‍ය නිමැවුම් බවට පත් වී ඇති ආකාරය සොයා වගුවක් මඟින් ඉදිරිපත් කරන්න.( පෙළ පොත අධ්‍යනය කරන්න.










4. මෙම උපකරණ හඳුනාගෙන නම් කරන්න.

5.ඒවායින් කරන කාර්ය කෙටියෙන් විස්තර කරන්න. මේ සඳහා ඔබේ පෙළ පොත අධ්‍යනය කරන්න.

6. පහසුවෙන් නිමැවුමක් කිරීමට අනුගමනය කළ යුතු කාර්යයන් මොනවාද?

7. මෙම අවස්ථා හඳුනාගෙන පැහැදිලි කරන්න.










8. භාණ්ඩ තැනීමේ දී එකලස් කිරීම යනු කුමක්ද?

9. එසේ එකලස් කරන ද්‍රව්‍ය ලයිස්තු ගත කරන්න.

10. එකලස් කිරීමට යොදා ගන්නා ක්‍රම මොනවාද?

11.වැඩ කරන පුද්ගලයන්ගේ ආරක්ෂාව සඳහා අනුගමනය කළ යුතු ආරක්ෂක පිළිවෙත් ලියන්න.

12. ඉවතලන ලෑලි කෑල්ලක් භාවිතයෙන් ඔබේ ගෙවත්තට නාම පුවරුවක් සකස් කරන්න. ඒ සඳහා පෙළ පොත අධ්‍යනය කරන්න.



# 04 තාක්ෂණික ක්ෂේත්‍රය - ව්‍යාපාර කටයුතු

## උචිත සැපයුම්කරුවන් ඇසුරින් සපුරමු නිසි වුවමනා



1.අවශ්‍යතා සහ වුවමනා යනු කුමක්ද?

2. පුද්ගලයකුගේ අවශ්‍යතා මොනවාද?

3. අවශ්‍යතා සහ වුවමනා වගුවක් ඇසුරින් සංසන්දනය කර දක්වන්න.





4. භාණ්ඩ සහ සේවා යන්න පැහැදිලි කරන්න.

5. ඔබට අවශ්‍ය භාණ්ඩ ලයිස්තුවක් ලියන්න.

6.භාණ්ඩ යන්න පැහැදිලි කරන්න.

7. ඔබට අවශ්‍ය සේවා ලයිස්තුවක් ලියන්න.

8.සේවා යන්න පැහැදිලි කරන්න.



9. යමක් මිල දී ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු මොනවාද?

10. ඔබට අවශ්‍ය භාණ්ඩ දෙකක් සඳහන් කරන්න.

11. ඔබ එම භාණ්ඩ මිලදී ගැනීමේ දී සැලකිලිමත් වන කරුණු මොනවාද?

12.ව්‍යාපාර ලෙස හැදින්වෙන්නේ කුමක්ද?

13.ඔබ ප්‍රදේශයේ ඇති ව්‍යාපර දෙකක් ලියන්න.

14. ඔබ ප්‍රදේශයේ සිටින ප්‍රාදේශීය සැපයුම් කරුවන් වර්ග කරන්න. පෙළ පොත අධ්‍යනය කරන්න.

15. ප්‍රාදේශීය සැපයුම් කරුවන් වැඩි වීමෙන් ඇතිවන වාසිය කුමක්ද?





16. ඔබ ප්‍රදේශයේ ලාබ ලැබීමේ අරමුණින් පවත්වා ගෙන යන ආයතන නම් කරන්න.

17. සේවා සැපයීමේ අරමුණින් පවත්වා ගෙන යන ආයතන නම් කරන්න.

18. ඔබ ප්‍රදේශයේ ඇති භාණ්ඩ හා සේවා සපයන, ලාභ ලැබීමේ අරමුණින් කටයුතු කරන ආයතන දෙකක් ලියන්න.



# 05 තාක්ෂණික ක්ෂේත්‍රය - රූපණ

## සරල රූප අඳිමු නිදහස් අතින්



1.ඔබ කැමති විධිමත් හැඩැති ද්විමාන රූප අඳින්න.

2. ඔබ කැමති අවිධිමත් හැඩැති ද්විමාන රූප අඳින්න.

මෙම රූපයේ ඇති (1) වක්‍ර රේඛා සහ (2) සරල රේඛා වෙන්කර අංක යොදන්න.









3. විවිධ සංකේත දක්වා ඇති ස්ථාන නම් කරන්න.

4. ඔබ කැමති මාතෘකාවකට සංකේතයක් නිර්මාණය කරන්න.

5. ඔබේ ක්‍රීඩා නිවාසය නියෝජනය කිරීමට සරල රේඛා පමණක් භාවිතා කර සංකේතයක් නිර්මාණය කරන්න.

6. පෙළ පොතේ තොරතුරු අධ්‍යනය කර පරිගණක මෘදුකාංගයක් භාවිතා කර සරල රූප මගින් සංකේත නිර්මාණය කර ඔබේ ගුරුතුමියට / ගුරුතුමාට පෙන්වා ලකුණු ලබා ගන්න. යහළුවන්ටද එය බෙදා හරින්න.

7. දුවේ, පුතේ ඔබ කැමති නිර්මාණ එකතුවක් කරන්න. (අවමය පහයි) එය විධිමත්ව හැකි ආකාරයකට ගුරුතුමියට / ගුරුතුමාට ඉදිරිපත් කර ලකුණු ලබා ගන්න.

ආදරණීය දුවේ පුතේ ඔබේ හැකියා හඳුනා ගන්න, නිර්මාණශීලී වන්න. නව නිපැයුම් ගැන සිතන්න. ලෝකය දිනන්න අලුතින් සිතන්න. ලොව ජයගත් පුද්ගලයන් ගැන වැඩිහිටියන්ගෙන් අසා දැන ගන්න. අන්තර්ජාල තොරතුරු ගවේෂණය කරන්න. වැඩදායි පුරවැසියකු වන්න උත්සහ ගන්න.



ගුරුභවතුන්ට උපදෙස් -

- දරුවන් අගය කිරීමට පෙළඹෙන්න.
- දරුවන්ගේ ඇගයීම් වෙනුවෙන්, මෙම පාඩම් ආශ්‍රිතව, නිර්ණායක මත, ඇගයුම් ක්‍රමවේද නිර්මාණය කර ගන්න.
- නිදහස් නිර්මාණවලට සිසු දරුවන් යොමු කර අවස්ථා පහක් ඇගයීමට ලක් කරන්න.
- කාර්ය සාධන පත්‍රිකාව සඳහා ලබා දෙන ඇගයීම් ලකුණු මේ වෙනුවෙන් පිරිනමන්න.